

# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

වෙළුම 10 කාණ්ඩය 01 මාර්තු 2021

# දෙනියාය උක් අභිජනන මධ්‍යස්ථානය ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණයට

ගරු රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමන් ඇතුළු නියෝජිත පිරිසක්, දෙනියාය එන්සල්වත්තේ පිහිටි උක් පර්යේෂණ ආයතනයේ අභිජනන මධ්‍යස්ථානයෙහි නිරීක්ෂණ චාරිකාවක යෙදුණු අතර, එහිදී, එම මධ්‍යස්ථානයේ මෑතක දී සිදු කරන ලද සංවර්ධන කටයුතු සහ එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට ලක්කරන ලදී. එම මධ්‍යස්ථානයේ යටිතල සහසුකම් වැඩිකිරීමට අමාත්‍යාංශය හරහා අවශ්‍යය සහය ලබාගැනීම සඳහා ව්‍යාපෘතියක් සැකසීමේ අවශ්‍යතාවත් එම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය හා වැදගත්කම මහජනතාවට හා අධ්‍යාපනය සඳහා උනන්දුවක් දක්වන සිසුන්ට ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීමේත් වැදගත්කම පෙන්වා දෙන ලදී.

මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක හා පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ යන මැතිතුමන් දෙපලත්, රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් එහි ලේකම් හා අතිරේක ලේකම් ද උක් පර්යේෂණ ආයතනයේ සභාපති හා අධ්‍යක්ෂ(වැ.බ) ඇතුළු පිරිසක් සහභාගී විය.



# වාණිජ උක් වගාවට විදේශීය ප්‍රභේද 50ක්

වර්තමානය වන විට උක් කර්මාන්තයේ සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමකින් අඩුවී ඇත. එයට විසඳුම් ලෙස නව උක් ප්‍රභේද වාණිජ වගාවට හඳුන්වා දීමටත් දැනට අනුගමනය කරන බෝග කළමනාකරණ ක්‍රමවේදවල වෙනස්කම් සිදු කිරීමටත් සීනි කර්මාන්ත නිලධාරීන් සමග පවත්වන ලද සාකච්ඡාවක දී තීරණය විය.

### ඇතුලු පිටු


2020 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයේ කාර්ය සාධනය 02

උක් කර්මාන්තයේ අතුරුඵලයන් වන පෙරහන්-මඩ සහ විනැස් උක් වගා ක්ෂේත්‍ර තුළ භාවිතයට 02

උක් වගාවට ගොවි මහතුන්ගේ ඉහළ ආකර්ෂණයක් 03

සුදු පත්‍ර රෝගයේ පැතිරීම පාලනය සඳහා එස්.එල්. 86 13 හා එස්.එල්. 92 5588 ප්‍රභේද 04

උක් කර්මාන්තයට අදාළ සියලුම ආයතන එකම අමාත්‍යාංශයක් යටතේ 04

එතනෝල්(ස්ප්‍රීතු)මිල ඉහළ යාමෙන් උක් කර්මාන්තයේ නව ප්‍රබෝධයක් 05

පාලක මණ්ඩල සභික මහාචාර්ය උදය රත්නායක සබරගමුව විශ්ව විද්‍යාලයේ උපකුලපති ධූරයට 05

උක් කර්මාන්තය නැංවීම සඳහා නව ප්‍රතිපත්ති ප්‍රකාශයක් 05

සීනි කර්මාන්ත තොරතුරු 2020 06

උක් වගාකරුවන් අතුරුබෝග වගාවට යොමුවීමේ වැඩි ප්‍රවනතාවක් 07

සීනි පවුලට එකතුවන අලුත්ම සාමාජිකයා 07

උක් කර්මාන්තය උතුරට 08


උක් පර්යේෂණ ආයතනය සතුව ඇති නව උක් ප්‍රභේද වාණිජ වගාවට හඳුන්වා දීමේ වැඩසටහනට අමතරව, මේ වන විට විදේශයන්ගෙන් ආනයනය කර ඇති, උක් පර්යේෂණ ආයතනය සතු උක් ප්‍රභේද වාණිජ වගාව සඳහා හඳුන්වාදීම සිදු කරන ලදී. එහිදී සියලුම සීනි කර්මාන්තායතන මැදිහත් වීමෙන්, ආනයනය කරන ලද ප්‍රභේද අතරින් වැඩි අස්වැන්නක් සහ වැඩි සීනි ප්‍රතිශතයක් සහිත ප්‍රභේද 50ක් තෝරා ගන්නා ලද අතර, එම ප්‍රභේද පැල්වත්ත, සෙවනගල සහ ගල්ඔය වැවිලි සමාගම් වෙත ලබා දෙන ලදී.

විදේශිය ප්‍රභේද 50 අතුරින් ප්‍රදේශයට ගැලපෙන වාණිජ උක් ප්‍රභේද තෝරා ගනිමින් ඒවා ව්‍යාප්ත කිරීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. මේ වන විට සියලුම සීනි කර්මාන්තවල මෙම විදේශිය ප්‍රභේදවල ප්‍රාථමික තවාන් ස්ථාපිත කර ඇති අතර, ඉදිරියේ දී එක් එක් ප්‍රදේශයට ගැලපෙන උක් ප්‍රභේද තෝරා ගැනීමට ද එමගින් හැකියාව ලැබෙනු ඇත.








# 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයේ කාර්ය සාධනය

2019 වර්ෂය හා සසඳන විට 2020 වර්ෂය තුළ රටේ සමස්ත සීනි නිෂ්පාදනය 16% කින් පමණ වැඩිවී තිබේ. එයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ ගල්ඔය වැවිලි සමාගමේ සීනි නිෂ්පාදනය 86%කින් පමණ ඉහළ යාමයි.(වගුව 1)

සීනි කර්මාන්ත තුනෙහිම සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 0.3% සිට සිට 0.5% දක්වා ප්‍රමාණයකින් අඩුවී ඇත. තවද, කර්මාන්තායතන තුනටම ඔවුන්ගේ වගා වපසරිය වැඩිකර ගැනීමට හැකි වුවත්, සාමාන්‍ය අස්වැන්න අඩුවී ඇත.

සමස්තයක් ලෙස අඹරන ලද උක් දඬු ප්‍රමාණය 11%කින් වැඩිවී ඇති අතර, මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගල්ඔය වැවිලි සමාගමේ ඇඹරුම් ප්‍රමාණය 2019 වසරට වඩා 37%කින් වැඩි වීමයි.

2020 වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ එතනෝල් නිෂ්පාදනය සලකා බලන ලද පසුගිය වසර 06ක කාලය තුළ ඉහළම අගය වාර්තාකර ඇති අතර, එය 2019 වසරට සාපේක්ෂව 15%ක වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම 2020 වර්ෂය තුළ දී එතනෝල් සඳහා ඉහළ මිලක් ලැබීම හේතුවෙන් සියලුම සීනි කර්මාන්තායතන සැලකිය යුතු ලාභයක් ඉපයීමට ද සමත්වී ඇත.

වගුව 1

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| **දේශීය සීනි නිෂ්පාදනය (මෙ.ටො)** | **55,972** | **61,265** | **55,552** | **51,265** | **52,304** | **60,678** ↑ |
| සෙවනගල | 14,377 | 17,234 | 15,198 | 14,709 | 16,013 | 16,071 |
| පැල්වත්ත | 27,612 | 34,188 | 27,643 | 28,061 | 25,162 | 23,582 ↓ |
| ගල්ඔය | 13,994 | 10,626 | 12,711 | 8,495 | 11,129 | 20,790 ↑ |
| **සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය(%)** | | | | | | |
| සෙවනගල | 7.41 | 7.34 | 7.67 | 6.59 | 6.90 | 6.57 |
| පැල්වත්ත | 7.58 | 8.21 | 7.30 | 7.55 | 7.61 | 7.30 |
| ගල්ඔය | 7.36 | 6.71 | 7.48 | 6.78 | 7.06 | 6.58 |
| **උක් වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර)** | | | | | | |
| සෙවනගල | 3,648 | 3,739 | 3,498 | 3,502 | 3,240 | 3,385 |
| පැල්වත්ත | 8,674 | 8,619 | 8,785 | 7,810 | 7,810 | 8,133 |
| ගල්ඔය | 3,082 | 3,163 | 2,749 | 3,081 | 5,158 | 5,850 |
| **සාමාන්‍ය උක් අස්වැන්න(මෙ.ටො/හෙක්.)** | | | | | | |
| සෙවනගල (වාරිපෝෂිත:වර්ෂාපෝෂිත) | 103 :61 | 105:64 | 92:54 | 110:71 | 105:66 | 101:61 |
| පැල්වත්ත | 53 | 41 | 48 | 47 | 40 | 39 |
| ගල්ඔය | 66 | 53 | 63 | 52 | 67 | 61 |
| **අඹරන ලද උක් දඬු ප්‍රමාණය(මෙ.ටො)** | **750,078** | **811,592** | **746,607** | **720,260** | **790,213** | **879,563** ↑ |
| සෙවනගල | 193,624 | 234,707 | 198,151 | 223,293 | 232,791 | 244,457 ↑ |
| පැල්වත්ත | 364,123 | 416,340 | 378,517 | 371,694 | 330,824 | 323,106 ↓ |
| ගල්ඔය | 192,331 | 160,545 | 169,939 | 125,273 | 226,598 | 316,000 ↑ |
| **එතනෝල් නිෂ්පාදනය (ලීටර් මිලියන)** | **6.2** | **11.8** | **7.0** | **13.0** | **12.5** | **14.4** ↑ |
| සෙවනගල | 2.1 | 4.3 | 3.3 | 4.2 | 2.2 | 3.3 ↑ |
| පැල්වත්ත | 4.1 | 7.5 | 3.7 | 5.5 | 5.6 | 5.5 ↓ |
| ගල්ඔය | - | - | - | 3.3 | 4.7 | 5.6 ↑ |

# උක් කර්මාන්තයේ අතුරුඵලයන්වන පෙරහන්-මඩ සහ විනෑස් උක් වගා ක්ෂේත්‍ර තුළ භාවිතයට





උක් කර්මාන්තයේ ප්‍රධාන අතුරුඵලයන් අතරින් පෙරහන්-මඩ සහ විනෑස් පරිසරයට හානි නොවන අයුරින් භාවිතාකර උක් වගාවේ ඵලදායීතාව වැඩි කරගත හැකි ආකාරය හා එහි වැදගත්කම පිළිබඳ වටිනා තොරතුරු රැසක් උක් පර්යේෂණ ආයතනය මෑතක දී ඒ හා සම්බන්ධව සිදු කරන ලද අධ්‍යයන මගින් ලබා දී ඇත.

සිදුකරන ලද ක්ෂේත්‍ර සහ විද්‍යාගාර පර්යේෂණයන්ට අනුව ශ්‍රී ලංකාවේ උක් වගා කෙරෙන සෙවනගල සහ පැල්වත්ත යන ප්‍රදේශවල පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙලින් 0.8 - 1.2% සහ 0.2 - 1.0% යන ප්‍රමාණයන්ගෙන් පවතින අතර, එය සැලකිය යුතු තරම් පහළ අගයක් වේ. එබැවින්, උක් වගාවේ දී රසායනික පොහොර භාවිතයත් සමගම කාබනික පොහොර/කාබනික ද්‍රව්‍ය පසට යෙදීම පාංශු පෝෂක ද්‍රව්‍ය චක්‍රීකරණයට මෙන්ම තිරසාර උක් වගාවක් සඳහා ද වැදගත් වේ.

පර්යේෂණයන්ගේ ප්‍රතිඵල අනුව පාරිසරික හෝ පාංශු හායනයකින් තොරව වගා බිම් හෙක්ටයාරයකට පෙරහන්-මඩ ටොන් 20 - 30ක ප්‍රමාණයක් ද විනෑස් ඝන මීටර 40ක් (ලීටර 40,000) ද පැළ සිටුවීමට සති 2-3ට ප්‍රථම උක් වගා ක්ෂේත්‍රයට යෙදීම වඩාත් සුදුසු යැයි නිර්දේශ කර ඇත.

එහිදී මෙම අතුරුඵලයන් පස සමඟ හොඳින් මිශ්‍ර වීම ඉතා වැදගත් වේ. විනෑස් ක්ෂේත්‍රයට යෙදීමේදී අවුරුදු 03ක ට වරක් පමණක් යෙදීම සිදු කළයුතු අතර, නැතහොත් එය පාංශු හායනයට හේතු සාධක විය හැකිය.

උක් වගා අතුරුඵල ක්ෂේත්‍රයට යෙදීම හේතුවෙන් පාංශු කාබනික ද්‍රව්‍ය මට්ටම ඉහළ නැංවෙන අතර, එහි ප්‍රතිඵලයන් ලෙස පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩිවීමත් පාංශු පෝෂණ ද්‍රව්‍යයන් ශාකයට අවශෝෂණය කළ හැකි ස්වභාවයෙන් පැවතීම ඉහළ නැංවීමත් සිදු වනු ඇත. තවද මනා කළමනාකාරීත්වයකින් යුතුව උක් වගාවේ අතුරුඵල භාවිතය පාංශු ඵලදායීතාවය මෙන්ම තිරසාර බව ද ඉහළ නැංවීමට මගපාදනු ඇත.

# උක් වගාවට ගොවි මහතුන්ගේ ඉහළ ආකර්ෂණයක්

උක් වගා කර්මාන්තයේ ප්‍රධාන අරමුණ වන සීනි නිෂ්පාදනයට අමතරව මධ්‍යසාර, විදුලි බලය, කාබනික පොහොර හා කාබන්ඩයොක්සයිඩ් වැනි අතුරු නිෂ්පාදන ද සිදුකරයි. 2019 වර්ෂයේ දේශීය සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 52,000ක් පමණ විය. එහෙත් 2019 වර්ෂය තුළ මෙරට ක්‍රියාකාරිත්වයේ පැවති සෙවනගල, පැල්වත්ත හා ගල්ඔය සීනි කර්මාන්ත ශාලාවල ඇඹරීමේ ධාරිතාව දිනකට ටොන් 6,550 පමණ වන අතර, මේවා පූර්ණ ධාරිතාවයෙන් දින 200ක් පමණ ක්‍රියාත්මකව පැවතියේ නම් නිපදවිය හැකිව තිබූ සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 105,000 පමණ වේ. එනම් එම කර්මාන්ත ශාලා නිෂ්පාදනය කර ඇත්තේ තම ධාරිතාවයෙන් අඩක පමණ සීනි ප්‍රමාණයකි. මෙයට ප්‍රධාන හේතුව ඇඹරීමට අවශ්‍ය උක් දඬු ප්‍රමාණවත් නොවීමයි.

### ඉහළ ස්ථාවර මිලක්

2020 වර්ෂයේ දී උක් දඬු ටොන් එකක් සඳහා ගෙවන මිල රු.5,500.00 දක්වා ඉහළ දැමීමත් සමග උක් වගාකරුවන්ට තම වගාවෙන් ලැබෙන ආදායම අනෙක් වගාවන්ට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. ඒ හේතුවෙන් වගාකරුවන් වැඩි වශයෙන් උක් වගාවට යොමු වෙමින් පවතින අතර, 2020 වර්ෂයේ උක් වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර 20,000 පමණ වේ. එය 2018 වර්ෂය හා සසඳන විට 38%ක පමණ වැඩිවීමකි. උක් සඳහා කර්මාන්ත ශාලාවලින් ගෙවන මිල ඉහළ යාමට අමතරව මිලෙහි අවධානම අවම වීම ද මේ සඳහා හේතු වී ඇත.

### වැඩි ආදායම් සහිත බෝගයක්

ශ්‍රී ලංකාවේ උක් වගාකරන ප්‍රදේශ ජලය සපයාගන්නා ක්‍රමවේදය අනුව වර්ෂාපෝෂිත හා වාරිපෝෂිත ලෙස ප්‍රධාන කලාප දෙකකට වෙන්වන අතර, වැඩි භූමි ප්‍රමාණයක් වර්ෂාපෝෂිත කලාපයට අයත් වේ. වර්ෂාපෝෂිත වගාව ප්‍රධාන වශයෙන් පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්ත ශාලා ආශ්‍රිතව ව්‍යාප්තව පවතින අතර, වාරිපෝෂිත වගාව ගල්ඔය හා සෙවනගල කර්මාන්ත ශාලා ආශ්‍රිතව පවතී. වර්ෂාපෝෂිත කලාපයේ උක් වගාවේ ප්‍රධාන තරගකාරී බෝග ලෙස බඩඉරිඟු, රටකජු, කව්පි, වට්ටක්කා හා කොමඩු සඳහන් කළ හැකිය. 2020 වර්ෂයේ මහ කන්නයට අදාළව එම තරගකාරී බෝගවල පිරිවැය හා ආදායම උක් බෝගයට සාපේක්ෂව වගුව 1 මගින් දක්වා ඇත..

වගුව 1 : වර්ෂාපෝෂිත කලාපයේ සාමාන්‍ය පිරිවැය හා ආදායම (වසරකට රුපියල්)

| අයිතමය | උක් | බඩඉරිඟු | කව්පි | රටකජු | වට්ටක්කා | කොමඩු |
|---|---|---|---|---|---|---|
| මුලු පිරිවැය | 189,539.00 | 189,550.00 | 238,000.00 | 207,950.00 | 172,500.00 | 219,000.00 |
| දළ ආදායම | 292,875.00 | 270,000.00 | 310,500.00 | 300,000.00 | 224,000.00 | 300,000.00 |
| ශුද්ධ ආදායම | 103,338.00 | 80,450.00 | 72,500.00 | 92,050.00 | 51,500.00 | 81,000.00 |
| රුපියලක් සඳහා ප්‍රතිලාභය | 1.54 | 1.42 | 1.30 | 1.44 | 1.29 | 1.36 |

ඉහළම ශුද්ධ ආදායමක් ලැබෙන්නේ උක් වගාවෙන්වන අතර, වැඩි උක් අස්වැන්නක් ලබා ගන්නා උක් ගොවි මහතුන්ට මෙයටත් වඩා ආදායමක් ලැබේ. එසේම ආයෝජනයක් ලෙස ඉහළම ප්‍රතිලාභයක් ලැබෙන බෝගය උක් වගාව වේ.



### අමතර ආදායම් අවස්ථා

රටකජු, කව්පි, උඳු, පිපිඤ්ඤා හා කොමඩු යන බෝග උක් වගාව සමග අතුරු බෝග ලෙස වගාකර අමතර අදායමක් ලබා ගැනීමට ද උක් ගොවීන්ට අවස්ථාව පැවතීම විශේෂයෙන් සැලකිය යුතුය. වාරිපෝෂිත කලාපයේ වසර හතරකට අදාළව සාමාන්‍ය වාර්ෂික පිරිවැයෙහි ඉහළම අගය කෝලිකුට්ටු කෙසෙල් වගාව සඳහා ද අවම අගය වී වගාව සඳහා ද වාර්තා විය. කෙසෙල් වගාව වාරිපෝෂිත කලාපයේ ඉහළම ලාභයක් ලැබෙන බෝගයයි. එහෙත් වී වගාව හා සැසඳීමේ දී උක් වගාවෙන් ලැබෙන ශුද්ධ අදායම ද ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය ද ඉහළ අගයක පවතී. (වගුව 2)

වගුව 2 : වාරිපෝෂිත කලාපයේ සාමාන්‍ය පිරිවැය හා ආදායම (වසරකට හෙක්ටයාරයකට රුපියල්)

| අයිතමය | උක් | | | වී |
|---|---|---|---|---|
| | | ඇඹුල් | කෝලිකුට්ටු | |
| මුලු පිරිවැය | 353,505.00 | 431,890.00 | 476,042.00 | 318,000.00 |
| දළ ආදායම | 595,375.00 | 783,750.00 | 844,650.00 | 512,875.00 |
| ශුද්ධ ආදායම | 241,870.00 | 351,860.00 | 368,608.00 | 194,875.00 |
| ආයෝජනය කළ රුපියලක් සඳහා ප්‍රතිලාභය | 1.68 | 1.81 | 1.77 | 1.61 |

### අඩු පිරිවැය බෝගයක්

උක් වගාව එක් වරක් ස්ථාපනය කිරීමෙන් අනතුරුව නිරි වගාව ලෙස වසර ගණනවක් අස්වනු ලබාගත හැකිවීම හේතුවෙන් ඉහළ පිරිවැයක් දැරිය යුතු වන්නේ මුල් වගාව සඳහා පමණි. එසේම බිම් සැකසීම සෑම වසරකදීම සිදු නොකරන නිසා පාංශු හානිය ද අවම මට්ටමක පවතී. මේ අනුව වර්ෂාපෝෂිත හා වාරිපෝෂිත තත්ව යටතේ අඩු පිරිවැයකින් වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි බෝගයක් ලෙස මේ වන විට උක් වගාව ගොවි මහතුන් අතර ජනප්‍රිය වෙමින් පවතී. එසේම මිලෙහි ස්ථාවර බව, රෝග හා පළිබෝධ හානි අවමවීම හේතුවෙන් ගොවි මහතුන් උක් වගාව සඳහා වැඩිපුර නැඹුරු වෙමින් පවතී. එනම් වැඩි ප්‍රතිලාභයක් ලබාගන්නා අතරම, රට සීනිවලින් ස්වයංපෝෂිත කිරීමේ රජයේ වැඩපිළිවෙලට දායක වීමේ අවකාශය ද උක් වගාව සඳහා යොමුවන ගොවි මහතුන්ට ලැබී ඇත.

# සුදු පත්‍ර රෝගයේ පැතිරීම පාලනය සඳහා එස්.එල්. 86 13 හා එස්.එල්. 92 5588 ප්‍රභේද

උක් වගාවේ සුදු පත්‍ර රෝගයට පූර්ණ ලෙස ප්‍රතිරෝධී උක් ප්‍රභේදයක් මේ දක්වා කිසිදු රටක් මගින් සොයා ගෙන නොමැති අතර, ඕනෑම ප්‍රභේදයක් සැලකීමේදී අඩු හෝ වැඩි වශයෙන් මෙම රෝගය ආසාදනය වීම දැක ගත හැකිය. මෙම රෝගය මගින් උක් වගාවේ නිරි අස්වනු සැලකිය යුතු ලෙස පහත හෙළීමේ හැකියාවක් ඇති අතර, මෙය නව උක් ප්‍රභේද ව්‍යාප්තිය කෙරෙහි ද අහිතකර ලෙස බලපා ඇත. එමනිසා, කාලය හා මුදල් වැය කරමින් නිපදවන නව ප්‍රභේදවල නියම ප්‍රතිඵල අත් කර ගැනීමට ද නොහැකි වී ඇත. කෙසේ වෙතත් පරිසරයේ රෝගකාරක ගහනය පාලනය සඳහා දිගින් දිගටම කටයුතු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර, ඒ සඳහා උක් කර්මාන්තයේ නියැලෙන සියලු දෙනාගේම අවධානය යොමුවිය යුතුය.

උක් වගාවේ සුදු පත්‍ර රෝගය ඉතා බහුලව පැතිරී ඇති ප්‍රදේශවලට උපක්‍රමික ලෙස යොදා ගැනීම සඳහා එම රෝගයට සැලකිය යුතු ප්‍රතිරෝධීතාවක් දක්වන උක් ප්‍රභේද කිහිපයක් හඳුනාගැනීමට උක් පර්යේෂණ ආයතනය විසින් කරන ලද පර්යේෂණ මගින් හැකිවී ඇත. රෝගය බහුලව ඇති ප්‍රදේශවලදී භාවිතා කිරීමට සුදුසු ප්‍රභේද පිළිබඳ සොයා බැලීම සඳහා පර්යේෂණ, පැල්වත්ත සීනි සමාගමේ කේන්ද්‍රීය වතු යාය ආශ්‍රිතව සිදු කරන ලද අතර, මේ සඳහා වාණිජ උක් වගාවට නිර්දේශ කර ඇති නව උක් ප්‍රභේද ඇතුළත්ව උක් පර්යේෂණ ආයතනය සතු ප්‍රභේද 50ක් යොදා ගන්නා ලදී.



සුදු පත්‍ර රෝගය පාලනය සඳහා නිරෝගී බීජ උක් භාවිතය, රෝගී පඳුරු ගලවා විනාශ කිරීම, සුදු පත්‍ර රෝග වාහකයා පාලනය කිරීම සහ වගා ක්ෂේත්‍රයේ සනීපාරක්ෂාව පවත්වා ගෙන යාම වැනි ක්‍රමවේදයන් නිර්දේශ කර ඇත. නමුත් විවිධ හේතු නිසාවෙන් ඉහත රෝග පාලන ක්‍රම අනුගමනය කිරීම දුර්වල මට්ටමක පවතී. මෙම රෝගය සමහර කාලවලදී වසංගත තත්වයන්ට පවා ළඟාවන අතර, උක් වගාවේ ඵලදායිතාව කෙරෙහි ද ඉතා අහිතකර ලෙස බලපා ඇත. මෙම තත්ව යටතේ කුමන ප්‍රභේදයක් හඳුන්වා දුන්නද එය එම බෝගයට ප්‍රශස්ථ තත්ව යටතේ පමණක් නොව, රෝග කාරක බහුල පරිසර තත්ව යටතේ ද වගා කිරීමට සිදු වී ඇත.

පරීක්ෂාවට ලක්කරන ලද කිසිදු ප්‍රභේදයක් සුදු පත්‍ර රෝගය සඳහා 100% ප්‍රතිරෝධී නොවූ අතර, එස් එල් 92 5588, එස් එල් 95 4225, එස් එල් 89 309, එස් එල් 86 13 සහ එස් එල් 99 3384 වැනි ප්‍රභේද, සුදු පත්‍ර රෝගය බහුලව ඇති ප්‍රදේශවලදී ප්‍රමාණවත් ප්‍රතිරෝධයක් දක්වනු ලැබීය. ඒ අතරින් එස් එල් 86 13 සහ එස් එල් 92 5588 වැනි ප්‍රභේද සුදු පත්‍ර රෝගය බහුල ප්‍රදේශ සඳහා උපක්‍රමිකව වගා කිරීමට නිර්දේශ කර ඇති අතර, එස් එල් 95 4225, එස් එල් 89 309 හා එස් එල් 99 3384 ප්‍රභේද මේ දක්වා වාණිජ වගාව සඳහා නිර්දේශකර නොමැති බැවින්, තවදුරටත් පරීක්ෂාකර බලා වගාව සඳහා නිර්දේශ කිරීමට කටයුතු කරමින් පවතී.

ඒ අනුව සුදුසු ප්‍රභේද තෝරා ගැනීම, සුදුසු බෝග පාලන ක්‍රම අනුගමනය කිරීම සහ අවශ්‍යය අවස්ථාවල දී උපක්‍රමික බෝග ලෙස නිර්දේශිත ප්‍රභේද වගා කිරීම මගින් රෝගකාරක ගහනය බොහෝ දුරට පාලනය කර ගත හැකි අතර, ඒ තුළින් උක් කර්මාන්තයේ ඵලදායිතාව තව දුරටත් ඉහළ නංවා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

# උක් කර්මාන්තයට අදාළ සියලුම ආයතන එක් අමාත්‍යාංශයක් යටතේ



උක් පර්යේෂණ ආයතනය



ලංකා සීනි පුද්ගලික සමාගම
පැල්වත්ත ඒකකය



ලංකා සීනි පුද්ගලික සමාගම
සෙවනගල ඒකකය



ගල්ඔය වැවිලි සමාගම



ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගම

උක් කර්මාන්තය නගාසිටුවීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ආයතන ලෙස උක් පර්යේෂණ ආයතනය සහ සියලුම සීනි කර්මාන්තායතන හැඳින්විය හැකිය. අතීතයේ මෙම ආයතන වෙන් වෙන් අමාත්‍යාංශවලට අයත්ව තිබුණි. නමුත් 2020 වර්ෂයේ සිට උක් පර්යේෂණ ආයතනය හා අනෙකුත් සියලුම සීනි කර්මාන්තායතන (ලංකා සීනි පුද්ගලික සමාගම, ගල්ඔය වැවිලි සමාගම හා ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගම) උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් අනුබද්ධ නිෂ්පාදන හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්කොට ඇති අතර එහි රාජ්‍ය අමාත්‍යවරයා ලෙස රත්නපුර දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජානක වක්කුඹුර මැතිතුමන් කටයුතු කරනු ලබයි. මෙමගින් සීනි කර්මාන්තායතන හා පර්යේෂණ ආයතනය අතර සෘජු සම්බන්ධතාවක් පවත්වා ගනිමින් ඉතා සමීපව වැඩකටයුතු කිරීමට පහසුවක් වී ඇත. එය ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයේ ප්‍රගමනයට හේතුවක් වනු නොඅනුමානය.

# එතනෝල්(ස්ප්‍රීතු)මිල ඉහළ යාමෙන් උක් කර්මාන්තයේ නව ප්‍රබෝධයක්

රජය විසින් එතනෝල් ආනයනය සම්පූර්ණයෙන්ම නතර කිරීම නිසා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ ඉතිරිකර ගැනීමට හැකිවී ඇත. මේ හේතුවෙන් සෙවනගල, පැල්වත්ත, ගල්ඔය යන කර්මාන්ත ශාලාවල නිපදවෙන එතනෝල් සඳහා ඉහළ මිලක් ලැබීමත් සමග ලංකා සීනි පුද්ගලික සමාගම හා ගල්ඔය වැවිලි සමාගම ලාභ ලබන ආයතනයන් බවට පත්වීමෙන් නව ජවයකින් ඉදිරියට යාමට අවස්ථාව උදා වී ඇත.

එතනොල් හෙවත් මධ්‍යසාර උක් කර්මාන්තයේ ප්‍රධාන අතුරුඵලයකි. සීනි නිෂ්පාදනයේ දී 5%ක ප්‍රමාණයක් ඉක්ෂුපාක නිපදවෙන අතර, මෙම ඉක්ෂුපාක ටොන් එකකින් එතනෝල් ලීටර 275-300 පමණ නිෂ්පාදනය කළ හැකිය. ඒ අනුව පැල්වත්ත, සෙවනගල හා ගල්ඔය යන සීනි කර්මාන්තශාලාවලින් 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් එතනෝල් ලීටර මිලියන 12.5 හා 14.5 නිෂ්පාදනය කරන ලදී.

2019 වර්ෂයේ දී සීනි කර්මාන්ත ආශ්‍රිත ස්කාගාරවලින් නිපදවූ එතනෝල් ලීටරයක තොග විකුණුම් මිල රු.350-440 විය. එහෙත් 2020 වර්ෂය ආරම්භයේ දී රජය විසින් එතනෝල් ආනයනය සීමා කිරීම හේතුවෙන් එතනෝල් ලීටරයක මිල රු.550-680 දක්වා මිල ඉහළයාම නිසා ලංකාවේ සීනි සමාගම්වලට රුපියල් මිලියන 3,150ක අතිරේක ආදායමක් ලබා ගැනීමට හැකිවිය.

ඒ අනුව 35 වසරක ඉතිහාසය තුළ ලැබූ ඉහළම ලාභය වන රුපියල් මිලියන 1,300ක් ඉක්මවූ මුදලක් 2020 වර්ෂයේ ලංකා සීනි පුද්ගලික සමාගම හිමිකරගත් අතර, මේ වන විට රටේ වැඩිම ලාභ ලබන රාජ්‍ය ආයතනයක් බවට පත්වීමට ද හැකියාව ලැබී ඇත. මෙය ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය නව දිශානතියකට යොමුවීමේ සුභ පෙරනිමිත්තක් වන අතර, එමගින් කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවක් ඉදිරියේ දී අපේක්ෂා කළ හැකිය.

# පාලක මණ්ඩල සභික මහාචාර්ය උදය රත්නායක සබරගමුව විශ්ව විද්‍යාලයේ උපකුලපති ධූරයට



2020 මාර්තු 03 දින සිට උක් පර්යේෂණ ආයතනයීය පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතුකරනු ලබන මහාචාර්ය උදය රත්නායක මහතා, 2020 නොවැම්බර් 02 දින සිට සබරගමුව විශ්ව විද්‍යාලයේ 07වන උපකුලපති ලෙස තේරී පත්විය. සබරගමුව විශ්ව විද්‍යාලයෙන් මෙතෙක් බිහිවූ ලාබාලතම උපකුලපතිවරයා ලෙස ද ඔහු ඉතිහාසයට එක්වේ.

මහාචාර්ය උදය රත්නායක රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ආදි විද්‍යාර්ථයෙකු වේ. ඔහු සිය විද්‍යාපති උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ද දර්ශනශූරි උපාධිය තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයෙන් ද ලබාගෙන ඇත. ආහාර මගින් බෝවන රෝග කාරක හඳුනාගැනීම මෙන්ම ශාඛ සාරවල ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයනයන් ඔහුගේ විෂය පථයට ඇතුළත් වේ.

උක් පර්යේෂණ ආයතනය ලෙස මහාචාර්ය උදය රත්නායක මහතාට මෙසේ සුභාශිංසන එක් කරමු.

# උක් කර්මාන්තය නැංවීම සඳහා නව ප්‍රතිපත්තියක්

2020 වසරේ දේශිය සීනි නිෂ්පාදනය ටොන් 60,678 වූ අතර එය දේශීය අවශ්‍යතාවයවූ ටොන් 610,000න් 9.9% ක් විය. 2019 වසරේ ප්‍රකාශයට පත් කරන ලද රජයේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දේශීය සීනි අවශ්‍යතාව මෙරට තුළම නිෂ්පාදනය කර ගැනීමට ඉලක්ක කර ඇත.

දේශීය සීනි අවශ්‍යතාවෙන් 90.1%ක්ම ආනයනය කරන තත්වයක් තුළ ගෝලීය සීනි මිල ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයට සෘජු බලපෑමක් එල්ල කරයි. ආර්ථික විශේෂඥයින් ප්‍රකාශකරන පරිදි, ගෝලීය සීනි මිල පුරෝකථනය කළ නොහැකි ලෙස විචලනයන්ට ලක්වේ. එමනිසා ලෝකයේ සීනි නිපදවන හා අපනයනය කරන රටවල්, මෙම සීනි මිල විචලනයන්ගෙන් තම රටවල සීනි කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි. එහෙත් එමගින් ලෝක සීනි මිල තවදුරටත් විෂමාකාර විචලනයන්ට ලක්වේ. මේ හේතුව නිසා ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය සංවර්ධනය කිරීමට සැලසුම්කර ඇති මේ අවස්ථාවේ, ලෝක සීනි මිල හා එම කර්මාන්තයේ සිදුවන විචලනයන්ගෙන් මෙරට සීනි කර්මාන්තය ආරක්ෂාකර ගැනීමට පැහැදිලි හා ක්‍රියාකාරී සීනි කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තියක් අවශ්‍යය වේ.

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධන, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මෙම අවශ්‍යතාව හඳුනාගෙන එම අමාත්‍යවරයාගේද මගපෙන්වීම යටතේ උක් පර්යේෂණ ආයතනය, ලංකා සීනි සමාගම හා ගල්ඔය සීනි සමාගම හා එක්ව ශ්‍රී ලංකාව සඳහා සීනි කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම අවසාන අදියරට ළඟාවෙමින් පවතී. එය, ආයතන, නිෂ්පාදන හා ඵලදායිතාව ඉහළ නැංවීම, උක් හා සීනි මිල, ආයෝජන, ඉඩම් හා ජලය, පාරිසරික හා බලශක්ති ඇතුළු ප්‍රතිපත්ති අංශ 10කින් සමන්විතවේ. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය නුදුරේදීම සීනි කර්මාන්තයේ අදාළ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත්කර අවශ්‍යය වෙනස්කම් ද සහිතව කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

# සීනි කර්මාන්ත තොරතුරු 2020

## නිෂ්පාදන තොරතුරු

| නිෂ්පාදන දත්ත | ඒකක | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| උක් වගාව සහිත සම්පූර්ණ භූමි ප්‍රමාණය(නිරි වගාව ඇතුළත්ව) | හෙක්ටයාර | 14,400 | 15,926 | 16,128 | 18,344 | 16,349 | 15,737 | 17,909 |
| අස්වනු නෙලූ භූමි ප්‍රමාණය | හෙක්ටයාර | 11,100 | 11,945 | 12,096 | 13,758 | 12,262 | 11,803 | 14,766 |
| ඇඹරූ උක් දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 644,000 | 657,000 | 750,333 | 798,000 | 748,000 | 720,000 | 729,000 |
| සාමාන්‍ය අස්වැන්න | මෙ.ටො./ හෙ. | 58 | 55 | 62 | 58 | 61 | 61 | 61 |
| සීනි නිෂ්පාදනය | මෙට්‍රික් ටොන් | 53,000 | 52,000 | 56,000 | 61,000 | 56,000 | 51,000 | 52,000 |
| සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය | % | 8.2 | 8.0 | 7.5 | 7.7 | 7.4 | 7.1 | 7.2 |
| සීනි ආනයනය | මෙට්‍රික් ටොන් | 548,000 | 520,000 | 624,000 | 651,000 | 498,000 | 645,000 | 556,000 |
| සීනි ආනයන වියදම | රුපියල් බිලියන | 37 | 37 | 49 | 49 | 39 | 40 | 35 |

## නිෂ්පාදන පිරිවැය හා ආදායම (හෙක්ටයාරයකට රුපියල්)

### සෙවනගල - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවු. 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 28,175.00 | — | |
| සිටුවීම/ නිරි කිරීම | 83,025.00 | 23,100.00 | |
| පොහොර යෙදීම | 19,500.00 | 19,500.00 | |
| වල් පැළෑටි මර්දනය | 40,108.00 | 31,761.00 | |
| ජලය සැපයීම | — | — | |
| අස්වනු නෙළීම හා පැටවීම | 129,200.00 | 122,400.00 | |
| අනෙකුත් පාලන කටයුතු | 24,000.00 | 18,000.00 | |
| පොලිය (අමුද්‍රව්‍ය) | 12,513.96 | 2,431.00 | |
| මුළු වියදම | 336,522.00 | 217,192.00 | 251,275.00 |
| අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 76 | 72 | 69 |
| දළ ආදායම | 418,000.00 | 396,000.00 | 379,500.00 |
| ශුද්ධ ආදායම | 81,474.00 | 178,808.00 | 128,225.00 |

### සෙවනගල - වාරිපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවු. 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 28,173.00 | — | |
| සිටුවීම/ නිරි කිරීම | 75,300.00 | 23,005.00 | |
| පොහොර යෙදීම | 21,000.00 | 21,000.00 | |
| වල් පැළෑටි මර්දනය | 52,406.00 | 43,228.00 | |
| ජලය සැපයීම | 30,500.00 | 23,000.00 | |
| අස්වනු නෙළීම හා පැටවීම | 216,000.00 | 207,000.00 | |
| අනෙකුත් පාලන කටයුතු | 18,000.00 | 18,000.00 | |
| පොලිය (අමුද්‍රව්‍ය) | 13,989.00 | 6,267.00 | |
| මුළු වියදම | 456,868.00 | 341,500.00 | 359,002.00 |
| අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 120 | 115 | 108.25 |
| දළ ආදායම | 660,000.00 | 632,500.00 | 595,375.00 |
| ශුද්ධ ආදායම | 203,131.00 | 291,000.00 | 236,373.00 |

### පැල්වත්ත - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවු. 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 29,700.00 | — | |
| සිටුවීම/ නිරි කිරීම | 63,000.00 | 24,880.00 | |
| පොහොර යෙදීම | 16,600.00 | 14,600.00 | |
| වල් පැළෑටි මර්දනය | 44,228.00 | 33,734.00 | |
| ජලය සැපයීම | — | — | |
| අස්වනු නෙළීම හා පැටවීම | 89,600.00 | 99,200.00 | |
| අනෙකුත් පාලන කටයුතු | 7,000.00 | 8,000.00 | |
| පොලිය (අමුද්‍රව්‍ය) | 7,551.00 | 3,064.00 | |
| මුළු වියදම | 257,679.00 | 183,478.00 | 190.428.00 |
| අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 56 | 62 | 53.25 |
| දළ ආදායම | 308,000.00 | 341,000.00 | 292,875.00 |
| ශුද්ධ ආදායම | 50,321.00 | 157,522.00 | 102,447.00 |

### හිඟුරාන - වාරිපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවු. 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 37,500.00 | — | |
| සිටුවීම/ නිරි කිරීම | 70,100.00 | 13,500.00 | |
| පොහොර යෙදීම | 20,200.00 | 21,200.00 | |
| වල් පැළෑටි මර්දනය | 35,140.00 | 32,540.00 | |
| ජලය සැපයීම | 20,000.00 | 20,000.00 | |
| අස්වනු නෙළීම හා පැටවීම | 120,000.00 | 108,000.00 | |
| අනෙකුත් පාලන කටයුතු | 21,600.00 | 25,000.00 | |
| පොලිය (අමුද්‍රව්‍ය) | 7,088.00 | 1,263.00 | |
| මුළු වියදම | 332,428.00 | 221,476.00 | 243,214.00 |
| අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 80 | 72 | 70 |
| දළ ආදායම | 440,000.00 | 396,000.00 | 385,000.00 |
| ශුද්ධ ආදායම | 107,572.00 | 174,000.00 | 141,786.00 |

මූලාශ්‍ර : උක් පර්යේෂණ ආයතනයේ සහ මහ බැංකු වාර්තා

# උක් වගාකරුවන් අතුරුබෝග වගාවට යොමුවීමේ වැඩි ප්‍රවනතාවක්







රටකජු, කව්පි, මුං, තල, උඳු, කොමඩු සහ පිපිඤ්ඤා උක් වගාව සමග අතුරුබෝග ලෙස වගා කළ හැකි අතර, මේ වන විට අතුරුබෝග වගාව සඳහා වැඩිපුර ගොවීන් පිරිසක් යොමු වෙමින් පවතී. මෙම අතුරුබෝග වගාව මගින් අමතර ආදායමක් කෙටි කාලයක් තුළ ලබාගත හැකි වීම මෙහි ඇති ප්‍රධාන වාසියකි.



අතුරුබෝග වගාව තව දුරටත් දිරිගැන්වීම සහ ප්‍රචලිත කරවීම සඳහා උක් පර්යේෂණ ආයතනය මගින් 2020 මහ කන්නයේ දී ක්ෂේත්‍ර ආදර්ශණ 100 කට ආසන්න ප්‍රමාණයක් පැල්වත්ත, බුත්තල, මොණරාගල, සියඹලාණ්ඩුව, ඇතිමලේ හා හිඟුරාණ වැනි ප්‍රදේශවල සංස්ථාපනය කරන ලදී. එහිදී තෝරාගත් ගොවීන් සඳහා අතුරු බෝග බීජ නොමිලේ ලබාදෙන ලදී. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ලංකා සීනි පුද්ගලික සමාගම, ගල්ඔය වැවිලි සමාගම හා ඇතිමලේ පුද්ගලික වැවිලි සමාගම්වල ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සහ කළමණාකාරිත්වයෙන් නොමඳ සහයෝගයක් ලැබුණි.

# සීනි පවුලට එකතුවන අලුත්ම සාමාජිකයා








දේශීය උක් කර්මාන්තයට නව ජවයක් එක් කරමින්, පුද්ගලික අංශයේ පූර්ණ ආයෝජන මත ඇතිමලේ වැවිලි (පුද්) සමාගමේ පළමු අදියරේ ඉදිකිරීමේ කටයුතු මොණරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේ කොටියාගල ප්‍රදේශය මුල්කරගෙන 2016 වසරේ දී ආරම්භ කළ අතර, දෙවන අදියර ලෙස කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් කටයුතු සියඹලාණ්ඩුව ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් 2018 වසරේදී ආරම්භ කර, 2020 වසරේ ඔක්තෝම්බර් අවසන් කරන ලදී.



ඇතිමලේ වැවිලි (පුද්) සමාගමට අනුබද්ධව මේ වන විට හෙක්ටයාර 3,456ක උක් වගාව ව්‍යාප්ත කර ඇති අතර, මින් හෙක්ටයාර 394ක් සමාගම සතු භූමි ප්‍රමාණයක වගා කටයුතු සිදුකර ඇත.

ශ්‍රී ලංකාවේ අනෙකුත් සීනි කර්මාන්තායතන මගින් දුඹුරු සීනි පමණක් නිෂ්පාදනය කරනු ලබන අතර, ඇතිමලේ වැවිලි (පුද්) සමාගම විශේෂ වන්නේ, සුදු සීනි නිෂ්පාදනය කරනු ලබන එකම සීනි කර්මාන්තායතනයවන බැවිනි. තවද, සීනි නිෂ්පාදන ක්‍රියාවලියේ දී ලැබෙන ඉක්ෂුපාක යොදාගෙන වසරකට මධ්‍යසාර ලීටර් මිලියන 3ක් නිෂ්පාදනය කිරීමේ සැලසුමක් ද මෙම කර්මාන්තශාලාව සතු වේ.



මෙම සීනි කර්මාන්තායතනය ඇතිවීමත් සමග සෘජු රැකියා අවස්ථා 650කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය වී ඇති අතර, වක්‍රව රැකියා, ආදායම් හා ප්‍රතිලාභ ලබන පිරිස 25,000කට අධිකවන බැවින් ඉදිරියේ දී සියඹලාණ්ඩුව සහ ඇතිමලේ යන ප්‍රදේශ මේ හරහා ශීඝ්‍ර දියුණුවක් කරා ළඟා වේ යැයි අපේක්ෂා කළ හැකිය.

# උක් කර්මාන්තය උතුරට



උක් පර්යේෂණ ආයතනය විසින් සැලසුම්කර කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය යටතේ මෙහෙයවනු ලැබූ උක් වගාව උතුරට වැඩසටහන උතුරු පලාතේ යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමේ අරමුණින් 2010 වසරේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චි ආනවිලුන්දාන් ප්‍රදේශයේ උක් හකුරු සහ උක් පැණි නිෂ්පාදන කටයුතු සාර්ථකව ආරම්භ කර ඇත. එහි මූලික පර්යේෂණ කටයුතු උක් පර්යේෂණ ආයතනය විසින් කිලිනොච්චි කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී සිදු කළ අතර, ප්‍රදේශයේ දේශගුණික තත්වයන්ට ගැළපෙන උක් ප්‍රභේද ඒ අනුව හඳුනා ගන්නා ලදී.

මෙම උක් වගා බිම් වලින් ලබාගන්නා අස්වැන්න ප්‍රදේශයේ උක් ගොවි සංවිධානය විසින් මෙහෙයවනු ලබන සැකසුම් ඒකකය වෙත ලබා දෙන අතර එහි දී නිෂ්පාදනය කරනු ලබන උක් පැණි හා හකුරු අලෙවි කිරීමේ කටයුතු උක් ගොවි සංවිධානය විසින්ම සාර්ථකව සිදුකරනු ලැබේ. හකුරු හා පැණි නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සැකසුම් ඒකකය සඳහා මුදල් ප්‍රතිපාදන කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සපයා ඇති අතර, මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා යන්ත්‍ර සූත්‍ර උක් පර්යේෂණ ආයතනය විසින් සපයා දෙන ලදී. මෙම සැකසුම් ඒකකයේ මෙහෙයවීම් කටයුතු ආනවිලුන්දාන් ප්‍රදේශයේ උක් ගොවි සංවිධානය විසින් පවත්වාගෙන යනු ලැබේ.







උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය උක් බීජ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා වන්නේරිකුලම් ප්‍රදේශයේ බීජ උක් තවානක් 2015 වසරේ දී ආරම්භ කරන ලදී. එමගින් නිෂ්පාදනය කරනු ලබන නීරෝගී බීජ උක් ගොවීන් වෙත බෙදා දෙමින් මේ වන විට අක්කර 15ක පමණ උක් වගාව ව්‍යාප්ත කර ඇති අතර, උක් ගොවීන් 45 දෙනෙකු සෘජුවම ව්‍යාපෘතිය සමග සම්බන්ධවී කටයුතු කරයි. උක් ගොවීන් හට වගාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය බිම් සැකසීම, බීජ උක්, පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය උක් පර්යේෂණ ආයතනය විසින් සපයා දෙන ලදී.


**විෂය උපදේශකත්වය**
ආචාර්ය එම්. එස්. පෙරේරා - අධ්‍යක්ෂ/ ප්‍ර. වි. නි (වැ. බ.)

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරි
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි

**පිටු සැකසුම හා පරිගණක සහය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි



**විමසීම්**
අධ්‍යක්ෂ
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
දුරකථන: +472233281, +472233285
ෆැක්ස්: +472233233
ඊ මේල්: info@sugarres.lk
වෙබ් අඩවිය: www.sugarres.lk

**For Imfomation**
Director
Sugarcane Research Institute
Uda Walawe
Telephone: +472233281, +472233285
Fax: +472233233
E-mail: info@sugarres.lk
Web site: www.sugarres.lk



ප්‍රකාශනය

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
කේ. පී. වික්‍රමසිංහ - පර්යේෂණ නිලධාරි
බී. ආර්. කුලසේකර - පර්යේෂණ නිලධාරි
පී. ඒ. ඒ. චතුරංග - පර්යේෂණ නිලධාරි
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් - සංවර්ධන නිලධාරි


උක් කර්මාන්තයට අදාල ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන හා ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය, උඩවලව